(හයවැනි පාර්ලිමේන්තුව — සිව්වැනි සභාවාරය)

අංක. 24.]

# පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රය

**2009 සැප්තැම්බර් මස 08 වැනි අඟහරුවාදා පූ. භා. 9.30 ට**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

0063/'09

1.

ගරු රවි කරුණානායක මහතා,— වාරිමාර්ග හා ජල කළමනාකරණ අමාත්‍යතුමා සහ වරාය හා ගුවන්සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) ගුවන් යානා සහ නැව්වලට ශ්‍රී ලංකාවේ ලියාපදිංචිවීමට 2008.01.01 දින සිට ක්‍රියාත්මක වූ අය-වැය ලේඛනයෙන් සහන සලසා තිබූ බව එතුමා දන්නෙහිද?

(ආ) (i) 2007.12.31 දින දක්වා ලියාපදිංචි වූ නැව් සහ ගුවන් යානා සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) මෙම සහන සැලසීමෙන් අනතුරුව, එලෙස ලියාපදිංචි වූ නැව් සහ ගුවන් යානා සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එම සහන සැලසීම නිසා අහිමිවූ ආදායම් ප්‍රමාණය කොපමණද;

(iv) එලෙස වෙනත් රටක පහසුකම් මත ලියාපදිංචිවීමේ සහනය ලබාදීම තුළින් අප ලබාගත් ප්‍රතිලාභ කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) එම සහන ලබාදීමෙන් අනතුරුව ලියාපදිංචි කරන ලද නැව් සහ ගුවන්යානා හිමිකරුවන්ගේ සහ කොටස්කරුවන්ගේ නම් කවරේද;

(ii) මෙහිදී ලබාගත් ප්‍රගතියේ මට්ටමට වඩා වැඩියෙන් ආකර්ෂණය කරගැනීමට නොහැකි වූයේ මන්ද;

යන්න එතුමා ප්‍රකාශ කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0089/'09

2.

ගරු ලක්ෂ්මන් නිපුණආරච්චි මහතා,— ප්‍රවාහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) දුම්රිය මාර්ග හරහා වැටී ඇති මාර්ග බොහොමයක, දුම්රියෙන් සිදුවිය හැකි අනතුරු වැළැක්වීමට පියවර ගෙන නැති බව එතුමා දන්නෙහිද?

(ආ) මානව සම්පත් ආරක්ෂාව සමග බැඳී ඇති මෙම ප්‍රශ්නය නොසලකා සිටීමට හේතු කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0097/'09

3.

ගරු ආර්. පී. ඒ. රණවීර පතිරණ මහතා,— අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) අතිගරු ජනාධිපතිතුමාගේ උපදේශකයින් ලෙස බඳවාගෙන ඇති මුළු සංඛ්‍යාව කොපමණද;

(ii) එසේ බඳවාගෙන ඇති අයගේ නම්, ලිපිනයන්, අධ්‍යාපන සුදුසුකම් හෝ විශේෂ සුදුසුකම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මෙම උපදේශකයින් සඳහා වැටුප් හෝ දීමනාවක් ලබා දෙන්නේද;

(ii) එසේ නම්, 2008 වර්ෂය සඳහා එක් එක් අය වෙත කොපමණ මුදලක් වෙන වෙනම ගෙවා තිබේද;

(iii) උපදේශකයින් ලෙස බඳවාගෙන ඇති පුද්ගලයින් සියලු දෙනා වෙනුවෙන් 2008 වර්ෂයේදී ගෙවා ඇති මුදල කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0216/'09

4.

ගරු ජේමසිරි මානගේ මහතා,— වාරිමාර්ග හා ජල කළමනාකරණ අමාත්‍යතුමා සහ වරාය හා ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,—(1)

(අ) ශ්‍රී ලංකා වරාය අධිකාරියේ පරිපාලන කටයුතු සඳහා ඉන්ටකොන්ටිනෙන්ටල් හෝටලය කුලී පදනම මත හෝ බදු පදනම මත ලබාගැනීමට අපේක්ෂා කරන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඒ සඳහා කැබිනට් පත්‍රිකාවක් ඉදිරිපත් කර තිබේද;

(ii) එසේ නම්, ඒ කවදාද;

(iii) ඉන්ටකොන්ටිනෙන්ටල් හෝටලය ගැනීමට වෙන්කර තිබෙන මුදල කොපමණද;

(iv) එම මුදල සොයා ගන්නේ කෙසේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0371/'09

5.

ගරු ආර්. එම්. ගාමිණී රත්නායක මහතා,— ප්‍රවාහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 2008.02.01 දිනැති අංක 1535 දරන ගැසට් නිවේදනය අනුව, විභාග දෙපාර්තමේන්තුව විසින් රියදුරු උපදේශකයන් ලියාපදිංචි කිරිම සඳහා වන ලිඛිත විභාගය 2008.04.26 වැනි දින පැවැත්වූ බව එතුමා දන්නෙහිද?

(ආ) (i) මෙම ලිඛිත විභාගය සඳහා අයදුම් කළ අයදුම්කරුවන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම විභාගය සඳහා පෙනී සිටි අයදුම්කරුවන් සංඛ්‍යාව කොපමණද;

(iii) රියදුරු උපදේශකයන් ලියාපදිංචි කිරීමේ ලිඛිත විභාගයෙන් සමත්වූ සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) ඉහත විභාගය සමත්වූ අයගේ නම්, ලිපිනයන් කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) මේ වනවිට රියදුරු උපදේශකයන් ලෙස ලියාපදිංචි කර ඇති සංඛ්‍යාව හා ඔවුන්ගේ නාම ලේඛනය එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඉ) රියදුරු උපදේශකයන් ලෙස ලියාපදිංචි කිරීමේ පදනම කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඊ) නොඑසේ නම්, ඒ මන්ද?

0451/'09

6.
ගරු රංජිත් අලුවිහාරේ මහතා,— මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මත්පැන් නිෂ්පාදනය කිරීම සඳහා භාවිතා කරන ස්ප්‍රීතු මෙරටට ගෙන්වන ආයතන සංඛ්‍යාව කොපමණද;

(ii) එම ආයතන, ඒවායේ අයිතිකරුවන්ගේ නම් සහ ලිපිනයන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත ආයතන මගින් මෙරට නිෂ්පාදනය කරනු ලබන මත්පැන් වර්ග කවරේද;

(ii) මෙම මත්පැන්වල නිෂ්පාදන ධාරිතාව කොපමණද;

(iii) මෙම එක් එක් ආයතන වලින් අලෙවි කරන නිෂ්පාදන වෙනුවෙන් පළාත් සභාවලට සහ මධ්‍යම රජයට වාර්ෂිකව ගෙවන බදු මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) (i) කිසියම් ආයතනයකට, 85% බද්ද රජයට හෝ අදාළ පළාත් සභාවට නොගෙවා තම නිෂ්පාදන වෙළෙඳ පොළෙහි අලෙවි කිරීමේ හැකියාවක් තිබේද;

(ii) මෙම 85% බද්ද ගෙවීම පැහැරහැරීම වළක්වාගැනීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0491 /09

7.
ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා,— මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) භාණ්ඩාගාර බිල්පත් හා භාණ්ඩාගාර වත්කම් හි ආයෝජනය කරන ලෙස 2009 ජනවාරි මස 01 වැනි දින මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යතුමා වශයෙන් මෙන්ම අතිගරු ජනාධිපතිතුමා වශයෙන් විදේශයන්හි ජීවත් වන ශ්‍රී ලාංකිකයින්ගෙන් හා සංක්‍රමික ශ්‍රමිකයින් වශයෙන් රැකියාවල නිරත වූවන්ගෙන් ඉල්ලා සිටින ලද ලිපියට අනුව, මේ වනවිට කොපමණ ශ්‍රී ලාංකිකයින් සංඛ්‍යාවක් මෙම ආයෝජන අවස්ථා සඳහා ලියාපදිංචි වී තිබේද;

(ii) එය දැනට විදේශයන්හි පදිංචි හා සංක්‍රමික රැකියාවල නිරත ශ්‍රී ලාංකිකයින්ගෙන් කොපමණ ප්‍රමාණයක්ද;

(iii) ඒ අනුව භාණ්ඩාගාර බිල්පත්වල ආයෝජනය කිරීමෙන් මෙරටට ලැබී ඇති විදේශ මුල්‍යා වත්කම් ප්‍රමාණය කොපමණද;

(iv) භාණ්ඩාගාර බැඳුම්කරයන්හි කරන ලද ආයෝජනයන්ගෙන් ලැබී ඇති විදේශ මුල්‍යා වත්කම් ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0090/'09

8.

ගරු ලක්ෂ්මන් නිපුණආරච්චි මහතා,— රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යතුමා සහ මුදල් හා ක්‍රමසම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,—(1)

(අ) (i) 1977 දේශපාලන පලිගැනීම්වලට ලක්වූවන්ගේ හා 1980 ජූලි වැඩ වර්ජනයෙන් රැකියා අහිමිවූවන්ගේ විශ්‍රාම වැටුප් ප්‍රශ්නය විසඳීම සඳහා පත්කළ කමිටු කවරේද;

(ii) එම කමිටු පත්කළ දිනයන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) පත්කළ කමිටු මගින් මෙතෙක් වාර්තා හෝ විසඳුම් ලබා නොදීමට හේතු කවරේද යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) විසඳුම් නොලැබීම නිසා අසාධාරණයට ලක්ව සිටින විශ්‍රාමිකයින්ගේ ගැටළු හා ඒ සම්බන්ධව ගනු ලබන පියවර කවරේද යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0224/'09

9.

ගරු පේමසිරි මානගේ මහතා,— සෞඛ්‍ය ආරක්ෂණ හා පෝෂණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,—(1)

(අ) (i) ''පෙතඩීන්'' එන්නත් මෙරටට ගෙන්වීමට ඇණවුම් කළේ කවදාද;

(ii) ඒ කොපමණ ප්‍රමාණයක්ද;

(iii) ''පෙතඩීන්'' එන්නත් රජයේ රෝහල්වලට ලබාදීම ආරම්භ කළේ කවදාද;

(iv) ''පෙතඩීන්'' එන්නත් භාවිත නොකර ඉතිරිව තිබෙන ප්‍රමාණය කොපමණද;

(v) ''පෙතඩීන්'' එන්නත් අපතේ යාමෙන් සිදුවූ මූල්‍යමය පාඩුව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ''මොපීන්'' එන්නත් මෙරටට ගෙන්වීමට ඇණවුම් කළේ කවදාද;

(ii) ඒ කොපමණ ප්‍රමාණයක්ද;

(iii) ''මොපීන්'' එන්නත් රජයේ රෝහල්වලට බෙදාහැරීම ආරම්භ කළේ කවදාද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0293/'09

10.

ගරු රවි කරුණානායක මහතා,— මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 2005 ජනවාරි මස 01 වැනිදා සිට 2008 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා සහ 2009 ජනවාරි මස 01 වැනි දින සිට මේ දක්වා කාලය තුළ—

(i) ලබාගත් මුළු ණය වෙනුවෙන් ගෙවිය යුතු පොළිය කොපමණද;

(ii) ඇමෙරිකානු ඩොලරයට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියලේ වටිනාකම කොපමණද;

(iii) ආනයන අනුපාතයට සාපේක්ෂව සංචිත ප්‍රමාණය කොපමණද;

(iv) දරිද්‍රතා මට්ටම කොපමණද;

(v) දරිද්‍රතා මට්ටමට අඩුවෙන් උපයන පවුල් සංඛ්‍යාව කොපමණද;

(vi) ගෙවුම් ශේෂය කොපමණද;

(vii) සහනාධාර ලබන පවුල් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) ඉහත (i) - (vii) අනුව, රට ප්‍රගතියක් අත්කරගෙන තිබේද, නැතහොත් පිරිහී තිබේද යන්න සාක්ෂි සහිතව එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

# ප්‍රධාන කටයුතු ආරම්භයේදී

## පනත් කෙටුම්පත් පිළිගැන්වීම පිළිබඳ දැනුම්දීම

1.

විදේශ රැකියා ප්‍රවර්ධන හා සුබසාධන අමාත්‍යතුමා,—ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය (සංශෝධන),— 1985 අංක 21 දරන ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි.

## යෝජනා පිළිබඳ දැනුම්දීම

2.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පාර්ලිමේන්තුවේ රැස්වීම්,— ස්ථාවර නියෝග 7 හි විධිවිධානවල සහ 2009.05.26 වැනි දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවේ කුමක් සඳහන්ව තිබුණ ද, අද දින රැස්වීම පැවැත්වෙන කාල වේලා පූ. භා. 9. 30 සිට අ. භා. 4. 30 දක්වා විය යුතු ය. අ. භා. 3. 30 ට ස්ථාවර නියෝග 7(5) ක්‍රියාත්මක විය යුතු ය.

# යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*1.

විශ්වවිද්‍යාල (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*2.

ධීවර සහ ජලජ සම්පත් අමාත්‍යතුමා,— ධීවර සහ ජලජ සම්පත් පනත යටතේ නියෝග,— 1996 අංක 2 දරන ධීවර සහ ජලජ සම්පත් පනතේ 61 වැනි වගන්තිය යටතේ ධීවර සහ ජලජ සම්පත් අමාත්‍යතුමා විසින් සාදන ලදුව, 2008 ඔක්තෝබර් මස 09 දිනැති, අංක 1570/32 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2009.08.18 වැනි දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතුය.

*3.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— පරිපූරක මුදල — ශීර්ෂය 105— වැඩසටහන 02,—† 2009 ජනවාරි මස 01 වැනි දිනෙන් ආරම්භව 2009 දෙසැම්බර් මස 31 වැනි දිනෙන් අවසන් වන මුදල් වර්ෂය තුළ සේවා සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ඒකාබද්ධ අරමුදලින් හෝ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ වෙන කිසියම් අරමුදලකින් හෝ මුදල්වලින් හෝ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ සුදුස්සක් කළ හැකිව තිබෙන මුදලකින් හෝ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය විසින් ලබාගන්නා කිසියම් ණය මුදලකින් හෝ රුපියල් මිලියන නවසියයකට (රු. 900,000,000) නොවැඩි පරිපූරක මුදලක් ගෙවිය යුතු අතර එම මුදල මෙහි පහත දක්වා ඇති උපලේඛනයෙහි නියමිත පරිදි වැය කළ යුතු ය.

උපලේඛනය

| | | | |
|---|---|---|---|
| ශීර්ෂය | 105 | — | ජාතිය ගොඩනැගීමේ හා වතු යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ අමාත්‍යාංශය |
| වැඩ සටහන | 02 | — | සංවර්ධන කාර්යයන් |
| ව්‍යාපෘතිය | 01 | — | අමාත්‍යාංශ ප්‍රධාන කාර්යාලය |

පුනරාවර්තන වියදම් රු. 900,000,000
රු. 900,000,000

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

† 2009 අගෝස්තු මස 18 වැනි දින ඉදිරිපත් කරන ලද 2009 අංක 12 දරන පරිපූරක ඇස්තමේන්තුව බලන්න. පරිපූරක ඇස්තමේන්තු අංක 1 සිට 11 දක්වා එකතුව රු. 19,530,903,938.

*4.

ඉන්දියානු ආගාමික කම්කරු (ඉවත්කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*5.

පාර්ලිමේන්තු මැතිවරණ (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*6.

වත්කම්වලින් ආවරණය වූ සුරැකුම්කරණය විධිමත් කිරීමේ පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*7.

රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*8.

ගෙවීම් පැහැර හරිනු ලැබූ බදු (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*9.

ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*10.

ශ්‍රී ලංකා රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ කොමිෂන් සභා (ඉවත් කිරීමේ) පනත් කෙටුම්පත— දෙවැනි වර කියවීම.

*11.

අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන්හට සහාය දීමේ සහ ආරක්ෂා කිරීමේ පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය (2008 ජූනි 17) [1]

*12.

ආණ්ඩුකාරවරයන්ගේ විශ්‍රාම වැටුප් පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*13.

ප්‍රතාපන විරෝධී සහ ප්‍රතිතෝලන බදු පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය (2006 අප්‍රේල් 04) [1]

*14.

බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) (සංශෝධන) පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය (2006 ජූලි 18) [1]

*15.

අක්‍රිය වත්කම් (ආපසු අයකර ගැනීමේ) පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය (2006 ජූලි 18) [1]

*16.

සුදු (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය (2006 ජූලි 18) [1]

*17.

ආරක්ෂණ පියවර පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය (2006 අප්‍රේල් 04) [1]

*18.

සිවිල් ගුවන් සේවා පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*19.

සිවිල් නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*20.

කැළෑ (සංශෝධන) පනත් කෙටුම්පත— දෙවැනි වර කියවීම.

*21.

පතල් හා ඛණිජ ද්‍රව්‍ය (සංශෝධන) පනත් කෙටුම්පත— දෙවැනි වර කියවීම.

*22.

කෘෂිකර්ම සංවර්ධන හා ගොවිජන සේවා අමාත්‍යතුමා,— පරිපූරක මුදල — ශීර්ෂය 285— වැඩසටහන 01,—† 2009 ජනවාරි මස 01 වැනි දිනෙන් ආරම්භව 2009 දෙසැම්බර් මස 31 වැනි දිනෙන් අවසන් වන මුදල් වර්ෂය තුළ සේවා සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ඒකාබද්ධ අරමුදලින් හෝ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ වෙන කිසියම් අරමුදලකින් හෝ මුදල්වලින් හෝ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ සුදුස්සක් කළ හැකිව තිබෙන මුදලකින් හෝ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය විසින් ලබාගන්නා කිසියම් ණය මුදලකින් හෝ රුපියල් හැටඅට කෝටි පනස්තුන් ලක්ෂ අනූතුන් දහස් නවසිය තිස් අටක් (රු. 68,53,93,938) නොවැඩි පරිපූරක මුදලක් ගෙවිය යුතු අතර එම මුදල මෙහි පහත දක්වා ඇති උපලේඛනයෙහි නියමිත පරිදි වැය කළ යුතු ය.

උපලේඛනය

| | | | |
|---|---|---|---|
| ශීර්ෂය | 285 | — | කෘෂිකර්ම දෙපාර්තමේන්තුව |
| වැඩ සටහන | 01 | — | මෙහෙයුම් වැඩසටහන |
| ව්‍යාපෘතිය | 01 | — | පරිපාලන හා ආයතන සේවා |

පුනරාවර්තන වියදම් රු. 68,53,93,938
රු. 68,53,93,958

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

† 2009 අගෝස්තු මස 18 වැනි දින ඉදිරිපත් කරන ලද 2009 අංක 11 දරන පරිපූරක ඇස්තමේන්තුව බලන්න. පරිපූරක ඇස්තමේන්තු අංක 1 සිට 10 දක්වා එකතුව රු. 18,845,510,000.

*23.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ තීරණය (අංක 1),— අංක 6/2006 දරන 2006.04.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ විධිවිධානයන්ට යටත්ව 2006.01.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි අග්‍රවිනිශ්චයකාරතුමා, ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරුන්, අභියාචනාධිකරණයේ සභාපතිතුමා සහ අභියාචනාධිකරණයේ විනිශ්චයකාරවරුන් සඳහා මාසික වැටුප් පහත සඳහන් පරිදි විය යුතු යැයි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 108(1) ව්‍යවස්ථාව යටතේ මෙම පාර්ලිමේන්තුව මෙයින් නිශ්චය කරනු ලබයි.

| | |
|---|---|
| ගරු අග්‍රවිනිශ්චයකාරතුමා | රු. 70,000/- |
| | රු. 1,500/- |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරුන් හා අභියාචනාධිකරණයේ සභාපති | රු. 65,000/- |
| අභියාචනාධිකරණයේ විනිශ්චයකාරවරුන් | රු. 63,500/- |

තවද, ශ්‍රේෂ්ඨාධිකරණයේ හා අභියාචනාධිකරණයේ විනිශ්චයකාරවරුන්ට ගෙවිය යුතු වැටුප් ලෙස 2004 සැප්තැම්බර් මස 09 වැනි දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර සම්මත කර ගන්නා ලද වැටුප් පරිමාණයන් වෙනුවට මෙම යෝජනාවෙන් නිශ්චය කරනු ලබන වැටුප් ක්‍රියාත්මක විය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව තවදුරටත් නිශ්චය කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*24.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ තීරණය (අංක 2),— 2008.07.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි අග්‍රවිනිශ්චයකාරතුමා, ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරුන්, අභියාචනාධිකරණයේ සභාපතිතුමා සහ අභියාචනාධිකරණයේ විනිශ්චයකාරවරුන් සඳහා, වැටුපෙන් 25%කට සමාන මාසික පෞද්ගලික දීමනාවක් ගෙවීමට ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 108(1) ව්‍යවස්ථාව යටතේ මෙම පාර්ලිමේන්තුව මෙයින් නිශ්චය කරනු ලබයි.

තවද, ශ්‍රේෂ්ඨාධිකරණ හා අභියාචනාධිකරණ විනිසුරුවරුන්ට ගෙවිය යුතු පෞද්ගලික දීමනාවක් ලෙස පාර්ලිමේන්තුව විසින් 1998 මාර්තු මස 17 වැනි දින සම්මත කරනු ලැබූ දීමනාවන් වෙනුවට මෙම යෝජනාවෙන් නිශ්චය කරනු ලබන පෞද්ගලික දීමනාවන් ක්‍රියාත්මක විය යුතු බව මෙම පාර්ලිමේන්තුව තවදුරටත් නිශ්චය කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*25.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ තීරණය (අංක 3),— 2007.08.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි අග්‍රවිනිශ්චයකාරතුමාට, ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරුන්ට සහ අභියාචනාධිකරණයේ සභාපතිතුමාට හා අභියාචනාධිකරණයේ විනිශ්චයකාරවරුන්ට පහත සඳහන් පරිදි මාසික ගෙවල් කුලී දීමනා ගෙවිය යුතු බව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 108(1) ව්‍යවස්ථාව යටතේ මෙම පාර්ලිමේන්තුව මෙයින් නිශ්චය කරනු ලබයි.

| | |
|---|---|
| ගරු අග්‍රවිනිශ්චයකාරතුමා | රු. 27,500/- |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරුන් හා අභියාචනාධිකරණයේ සභාපති | රු. 25,000/- |
| අභියාචනාධිකරණයේ විනිශ්චයකාරවරුන් | රු. 22,500/- |

තවද, ශ්‍රේෂ්ඨාධිකරණයේ හා අභියාචනාධිකරණයේ විනිශ්චයකාරවරුන්ට ගෙවිය යුතු ගෙවල් කුලී දීමනාව ලෙස 2004 සැප්තැම්බර් මස 09 වැනි දින පාර්ලිමේන්තුව විසින් නිශ්චය කරනු ලැබූ දීමනාව වෙනුවට මෙම යෝජනාවෙන් නිශ්චය කරනු ලබන ගෙවල් කුලී දීමනාව ක්‍රියාත්මක විය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව නිශ්චය කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*26.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ තීරණය (අංක 4),— 2008.07.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි අග්‍රවිනිශ්චයකාරතුමාට, සංග්‍රහ දීමනාව ලෙස මාසිකව රු. 3,500/- ක දීමනාවක් ගෙවීමට ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 108(1) ව්‍යවස්ථාව යටතේ මෙම පාර්ලිමේන්තුව මෙයින් නිශ්චය කරනු ලබයි.

තවද, මෙයට පෙර අගවිනිසුරුවරයා සඳහා පාර්ලිමේන්තුව නිශ්චය කර ඇති සංග්‍රහ දීමනාව වෙනුවට මෙම යෝජනාවෙන් නිශ්චය කරනු ලබන සංග්‍රහ දීමනාව ක්‍රියාත්මක විය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව මෙයින් නිශ්චය කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*27.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— සුරා බදු ආඥාපනත යටතේ රීති,— (52 වැනි අධිකාරය වූ) සුරාබදු ආඥාපනතේ 32 වැනි වගන්තිය යටතේ ජනාධිපතිතුමා විසින් සුරාබදු සම්බන්ධයෙන් පනවන ලදුව, 2008 අප්‍රේල් මස 10 දිනැති අංක 1544/17 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2008.06.19 වැනි දින ඉදිරිපත් කරන ලද රීති අනුමත කළ යුතු ය.

*28.

තැපැල් හා විදුලි සංදේශ අමාත්‍යතුමා,— තැපැල් කාර්යාල ආඥාපනත යටතේ ව්‍යවස්ථාව,— (190 වැනි අධිකාරය වූ) තැපැල් කාර්යාල ආඥාපනතේ අංක 12, 21, 25, 27, 81, 62, 06, 39, 49, 44, 68, 67, 40, 24, 59, 60, 35, 59, 67 හා 64 යන වගන්ති යටතේ තැපැල් හා විදුලි සංදේශ අමාත්‍යතුමා විසින් මුදල් අමාත්‍යතුමාගේ එකඟත්වය ඇතිව සම්පාදනය කරන ලදුව, 2007 අප්‍රේල් මස 25 දිනැති අංක 1494/10 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2007.07.17 වැනි දින ඉදිරිපත් කරන ලද ව්‍යවස්ථාව අනුමත කළ යුතු ය.

*29.

සෞඛ්‍ය ආරක්ෂණ හා පෝෂණ අමාත්‍යතුමා,— වෛද්‍ය ආඥාපනත යටතේ නියෝග,— (105 වැනි අධිකාරය වූ) වෛද්‍ය ආඥාපනතේ 72 වැනි වගන්තිය සමග කියවිය යුතු 19 වැනි වගන්තිය යටතේ සෞඛ්‍ය ආරක්ෂණ හා පෝෂණ අමාත්‍යතුමා විසින් ශ්‍රී ලංකා වෛද්‍ය සභාව විමසා සාදන ලදුව, 2009 පෙබරවාරි මස 25 දිනැති අංක 1590/13 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2009.04.21 වැනි දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

30.

දහනව වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

31.

උතුර සහ නැගෙනහිර දෙපළාත තාවකාලිකව ඒකාබද්ධ කිරීම අහෝසි කිරීමේ (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

32.

ග්‍රාස්රූට්ස් පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

33.

මහින්දානන්ද අලුත්ගමගේ පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

34.

බලහත්කාරයෙන් ආගම්වලට හරවා ගැනීම තහනම් කිරීමේ පනත් කෙටුම්පත — සලකා බැලීම.

* **සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.**

---

**[1]**

" පනත් කෙටුම්පත දැන් දෙවැනි වර කියවිය යුතුය" යනුවෙන් යෝජනා කරන ලදින් ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.

---

# වාචික පිළිතුරු අපේක්ෂා නොකරන ප්‍රශ්න

0022/'09

1.

ගරු රවි කරුණානායක මහතා,— වාරිමාර්ග හා ජල කළමනාකරණ අමාත්‍යතුමා සහ වරාය හා ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) මේ දක්වා වූ පසුගිය වසර 4ක කාලය තුළ එක් එක් වර්ෂයේදී, වරාය හා ගුවන් සේවා අමාත්‍යාංශය විසින් සහ එම අමාත්‍යාංශයට අයත් ඕනෑම සමාගමක් සඳහා කුලියට ගත් එක් එක් වාහනය වෙනුවෙන් ගෙවන ලද මුළු මුදල හා කුලියට ලබා ගත් කාර්යාලයීය ඉඩකඩ සඳහා ගෙවන ලද මුළු මුදල කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) උක්ත කාල සීමාව තුළ —

(i) ඉහත කී වාහන සඳහා ඉන්ධන වෙනුවෙන් වැය කළ මුදල කොපමණද හා එම මුදල අමාත්‍යාංශයේ සමස්ත පුනරාවර්තන වියදම් වලින් කුමන ප්‍රතිශතයක්ද;

(ii) ඉහත සඳහන් කාර්යාලයීය ඉඩකඩ සඳහා එක් වර්ග අඩියක් වෙනුවෙන් වැය කළ මුදල කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) කල්බදු ක්‍රමය යටතේ එම ගොඩනැගිල්ල ලබා ගෙන ඇත්තේ කොපමණ කාලයක් සඳහාද හා තැන්පතුවක් ලෙස අත්තිකාරම් වශයෙන් ගෙවන ලද මුදල කොපමණද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0440/'09

2.

ගරු රංජිත් අලුවිහාරේ මහතා,— අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,—(1)

(අ) මධ්‍යම පළාත් සභා මැතිවරණ රාජකාරි සඳහා යෙදවූ ඡන්ද මධ්‍යස්ථාන භාර නිලධාරීන්ගේ නාම ලේඛනය, එම නිලධාරීන් සේවය කරන ආයතන සහ තනතුරු මාතලේ, මහනුවර සහ නුවරඑළිය දිස්ත්‍රික්කයනට අදාළව වෙන් වෙන් වශයෙන් කවරේද යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ආ) (i) ඌවඹ පළාත් සභා මැතිවරණ රාජකාරි සඳහා යෙදවූ ඡන්ද මධ්‍යස්ථාන භාර නිලධාරින්ගේ නාම ලේඛනය, එම නිලධාරීන් සේවය කරන ආයතන, තනතුරු හා දිස්ත්‍රික්ක ලෙස වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) මධ්‍යම හා ඌවඹ මැතිවරණ දිනයන්හි ක්‍රියාත්මක වූ පරිගණක කාර්යාලයේ නිලධාරින්ගේ නම්, තනතුරු සහ ආයතන වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?